# උතුරු පළාත් රාජ්‍ය සේවයේ පවතින ඒකාබද්ධ රියදුරු සේවයේ මෝටර් රථ රියදුරු III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය – 2018

උතුරු පළාත් රාජ්‍ය සේවයේ ඒකාබද්ධ රියදුරු සේවයේ මෝටර් රථ රියදුරු III වනි ශ්‍රේණියේ තනතුරු සඳහා පවතින පුරප්පාඩු **36** ක් සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් **2018 අප්‍රේල් මස** පවත්වන බව දන්වා සිටිනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **21.03.2018**වේ.

**02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි:-**

02.1 උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද 2013.07.01 දින සිට බලපවත්තින ඒකාබද්ධ රියදුරු සේවයේ මෝටර් රථ රියදුරු තනතුරේ සේවා ව්‍යවස්ථාවේ අනුමත කරන ලද කොන්දේසි සහ බඳවා ගැනීමේ ව්‍යවස්ථාවේ විධිවිධාන යනාදිය හා ඒවායෙහි කලින් කලට සිදු කරනු ලබන වෙනස් කිරීම් වලටත්, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා සමාජවාදී ජන රජයේ අංක **1817/30** සහ**2013.07.03** වැනි දින අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයේ ආයතන සංග්‍රහය යනාදියට අනුකූලව තෝරා ගන්නා ලද අයදුම් කරුවන් එම තනතුරේ 111 වැනි ශ්‍රේණියට පත් කරනු ලැබේ.

02.2 මෙම විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් පත්වීම් දිනයේ සිට වසර 03 පරිවාස කාලයකට යටතේ 111 වැනි ශ්‍රේණි තනතුරට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතය. සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ඒකාබද්ධ රියදුරු සේවයේ මෝටර් රථ රියදුරු තනතුරේ III වනි ශ්‍රේණියට බඳවා ගන්නා ලද දිනයේ සිට වසර 03 ක කාලයක් ඇතුලත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්විය යුතුය.

02.3 මෙම සේවය ස්ථානමාරු සහිත සේවයකි. එබැවින් මෙම පත්වීම් ලබන රියදුරන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළයුතු බවට වූ කොන්දේසියට යටත්විය යුතුය.

02.4 එක් සේවා ස්ථානයක පත්වීම් ලබන රියදුරා එකී සේවා ස්ථානයේම අවම වශයෙන් වසර 05 ක් අඛණ්ඩව සේවය කළයුතු බවට අනිවාර්ය වූ කොන්දේසියකි.

02.5 රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 01/2014 සහ මේ සම්බන්ධයෙන් යථා කාලයේ දි නිකුත් කරණු ලබන චක්‍ර ලේඛ වලට අනුව පත්වීමේ දිනයේ සිට වසර 05 ක් අවසන්වීමට පෙර එහි සඳහන් දෙවන රාජ්‍ය භාෂාවකින් සමත්විය යුතුය.

02.6 පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක කරණු ලබන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරණු ලැබේ. ඇතැම් පුරප්පාඩු හෝ සම්පූර්ණ පුරප්පාඩු සම්පූර්ණ නොකර සිටීමට පත්වීම් බලධාරියාට බලය ඇත. පත්කරනු ලබන නිලධාරී සංඛ්‍යාව **36 ක්** වෙ.

**03. වැටුප් පරිමාණය:-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016ට අනුව (කේත අංක PL-3-2016) ඒකාබද්ධ රියදුරු සේවයේ මෝටර් රථ රියදුරු තනතුරේ III වන ශ්‍රේණියේ තනතුර සඳහා ඒකාබද්ධ වැටුප් පරිමාණය මාසිකව **රු. 25,790 - 10 x 270/= - 10 x 300/= - 10 x 330/= - 12 x 350 - රු 38,990 ක් වේ.** (රු. 26,600/= වැටුප් පියවරට පැමිණීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකින් සමත් විය යුතුය) එහෙත් ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

**04. සාමාන්‍ය සුදුසුකම්:-**

04.1 අයදුම්කරු ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.

04.2 අයදුම්කරු උතුරු පළාතේ කුමන හෝ ප්‍රාදේශයක සේවය කිරීමට හැකි පරිදි මනා ශරීර සෞඛ්‍යකින් හා හොඳ චරිතවත් පුද්ගලයෙක් විය යුතුය.

04.3 අ) අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය. එනම් මෙම අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්නයෙන් වසර 06 ක කාලය තුළ අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවෙකු විය යුතුය.

**හෝ**

ආ)අයදුම්කරු හෝ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර අඩුම වශයෙන් වර්ෂ 05 ක් වත් උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුය. (සම්මුඛ පරීක්ෂණයේදී ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛනයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.)

04.4 අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට **නොඅඩු හා අවුරුදු 45ට** නොවැඩි වියු යුතුය.

04.5 මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර, ඉල්ලුම් කරන ලද සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතු යි.

**05 අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්:-**

**(අ) අධ්‍යාපන සුදුසුකම්**

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගනනකදී භාෂා මාධ්‍ය (සිංහල /දෙමළ /ඉංග්‍රිසි) හා, කුමක් හෝ වෙනත් විෂයයක් ඇතුළුව විෂයයන් දෙකකට (02) සමමාන සාමාර්ථයන් සමග විෂයයන් 06 කින් සමත්විය යුතු අතර, එක් වරකදී අවම වශයෙන් විෂයන් 05 ක් වත් සමත්විය යුතුය.

(ආ) **වෘත්තීය සුදුසුකම් (අදාල වෘත්තීය සුදුසුකම් සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ)**

1. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් තුමා විසින් නිකුත් කරන ලද පිළිගත් හොන්ඩර 24(cwt) යට නොඅඩු ස්ටේෂන් වැගන් හා පුද්ගලික / කුලී රථය පැදවීමට අනුමත බලපත්‍ර ලබා තිබීම
2. අයදුම්පත්‍ර් අවසන් දිනට පෙර අවුරුදු 03 ක් කලින් අයදුම්කරුගේ රියදුරු බලපත්‍රයේ පැරණි ශ්‍රේණියට අදාළ වාහන පන්ති C හෝ C1 ලබා තිබිය යුතු හෝ සංශෝධනය කරන ලද ශ්‍රේණිය අනුව වාහන පන්ති B වර්ගය ලබා තිබිය යුතුයි
3. මහාමාර්ග හා නීතිරීති සම්බන්ධයෙන් මනා දැනුමක් ලබා තිබීම

**(ඉ) පළපුරුද්ද**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට රිය පැදවීම සම්බන්ධයෙන් අවුරුදු තුනක වාහන පැදවීමේ පළපුරුද්දක් ලබා තිබිය යුතුයි (මෙම පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුයි)

**(ඊ) ශාරීරික සුදුසකම්**

1. අවම වශයෙන් අඩි **5'** අඟල් **2.5"** (**සෙ.මී 158.75**) උසින් යුක්ත විය යුතුයි
2. රාත්‍රි කාලයේදී හා දවල් කාලයේදී තම රාජකාරිය ඉටු කිරීමට සඳහා මනා පෙනීමකින් හෙබි නිරෝගි කායික හා මානසිකත්වයකින් හෙබි පුද්ගලයෙකු විය යුතුයි සම්මුඛ පරීක්ෂණයේදී රජයේ වෛද්‍ය අධිකාරී විසින් නිකුත් කරන ලද සහතික මගින් මෙය සනාථ කළ යුතුයි.

**06 බඳවා ගැනීමේ ක්‍රමය :-**

06.1 ලිඛිත පරීක්ෂණයක් පදනම් කරගෙන බදවා ගන්නා අවස්ථාවේ දී බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ, බඳවා ගැනිමේ පරිපාටිය ජාතික සහ පළාත් ප්‍රතිපත්ති යනාදියට අනුව බඳවා ගනු ලැබේ. මෙම දැන්වීම මගින් ඉල්ලා සිටින සුදුසුකම් සියල්ලම සම්මුඛ පරීක්ෂණයේ දි පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍යවන සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වු හිමිකම් අවලංගු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දි සියලුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. ඒ සඳහා අමතර ලකුණු කිසිවක් ලබාදෙනු නොලැබේ.

06.2 ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන අපේක්ෂකයින්ගෙන් ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් ලැබූ මුලු ලකුණු සංඛ්‍යා අනුපිළිවෙල පරිදි පවතින පුරප්පාඩු සඳහා පත්වීම් ලබාදිමට තෝරාගනු ලැබේ

**07 විභාග ගාස්තු :-**

අයදුම්කරු පදිංචිව සිටින උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු. 500/= ක මුදලක් **උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් තුමාගේ අංක 3401** දරණ තැන්පත් ගිණුමට බැර කරන ලද මුදල් කුවිතාන්සිය අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා ඉදිරිපත් කළ යුතුය. කුමන කරුණක් මත හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට අනුමත කරනු නොලැබේ.

**08 ඉල්ලුම් කිරීමේ ක්‍රමය :-**

08.1 මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව A4 ප්‍රමාණයේ (සෙමී 21 X සෙමී 29) ප්‍රමාණයේ කොළයක 01 සිට 10.2 දක්වා වූ කොටස් පළමුවැනි පිටුවේත්, ඉතිරි ඒවා අනෙක් පිටුවේත් ඇතුලත්වන පරිදි අයදුම් පත්‍රය පිළියෙළ කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2018.03.21** වැනි දිනට හෝ ඊට පෙර ලැබීමට හැකිවන පරිදි **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත අංක 393/48, කෝවිල් පාර, යාපනය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

08.2 එවනු ලබන ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ **"උතුරු පළාත් රාජ්‍ය සේවයේ ඒකබද්ධ රියදුරු සේවයේ මෝටර් රථ රියදුරු සේවයේ III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018"** යනුවෙන් සඳහන් කළ යුතුය.

08.3 අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් තමාවෙත තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් සහ පූර්ව පිටපත් යනාදිය භාරගනු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කරනු ලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය එවනු ලැබීම අයදුම්කරු විසින් සියලු සුදුසුකම් සපුරා ඇති බවට අදහස් නොකෙරේ.

08.4 අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 03 ට වත් කලින් ප්‍රවේශ පත්‍රය නොලැබී ඇත්නම් ඒ බව පහත සඳහන් විස්තර සහිතව **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය **021- 221 9939**, ෆැක්ස් අංකය **021- 221 9940**)

**සටහන:**
ඉල්ලීමේ ලිපිය, විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම් පත් අංකය, අයදුම්කරුගේ තැපැල් ලිපිනය, අයදුම් පත්‍රයේ පිටපතක්, අයදුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් යවන ලද තැපැල් කාර්යාලය, ලියා පදිංචි අංකය සහ දිනය, විභාග ගාස්තු ගෙවූ සහතික කරන ලද ඡායා පිටපත, ප්‍රවේශ පත්‍රය යැවිය යුතු ෆැක්ස් අංකය.

**09 පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරීම :-**

අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම විභාග ශාලාධිපතිට සෑහීමකට පත්විය හැකි අයුරින් තම අනන්‍යතාවය තහවුරු කරනමෙන් ඉල්ලා සිටිනු ලැබේ. පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛන වලින් කුමණ හෝ එකක් පිළිගනු ලැබේ.

(1) පුද්ගලයන් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත.
(11) වලංගු විදේශ ගමන් බලපත්‍රයක්. (Passport)

ඉහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම් කරුවෙකුගේ හිමිකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ගේ අභිමතය පරිදි අවලංගුකළ හැකිය. විභාගය පැවැත්වීම පිළිබඳව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නීති රීතිවලට අයදුම්කරුවන් අවනතවිය යුතුය. එකී නීති රීතිවලට පටහැනිව කටයුතු කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත්විය යුතුය.

**10 අසත්‍ය තොරතුරු සඳහා දඬුවම් :-**

අයදුම්පත්‍ර පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතුයි.මෙම විභාග කොන්දේසිවලට අනුව යම්කිසි අපේක්ෂයන් විභාගයට පෙර, විභාගයේදී හෝ විභාගයට පසුව කුමන හෝ අවස්ථාවකදී සුදුසුකම් නැති බව අනාවරණය වුවහොත්, එම අයදුම්කරුගේ විභාග අයිතිවාසකම් එම අවස්ථාවේදීම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු සපයන ලද තොරතුරු කිසිවක් අසත්‍ය බව අනාවරණය වුවහොත්, ඕනෑම අවස්ථාවක පළාත් රාජ්‍ය සේවයෙන් ඉවත් කල හැක.

**11 විභාග පරිපාටිය :-**

මෙම විභාගය ලිඛිත පරීක්ෂණය හා වෘත්තීය පරීක්ෂණය යන කොටස් දෙකකින් යුක්තවන අතර ලිඛිත පරීක්ෂණය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍රවලින් යුක්ත වේ. මෙම පරීක්ෂණය සිංහල හා දෙමළ යන භාෂා දෙකින් පවත්වනු ලැබේ. අයදුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

### 11.1 ලිඛිත පරීක්ෂණය

මෙම පත්වීම සඳහා සුදුසුකම් ලබා ගැනීමට ලිඛිත පරීක්ෂණයේ ප්‍රශ්ණ පත්‍ර සියල්ලටම අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතුවේ. සමස්ත ලකුණුවලින් අවම වශයෙන් ලකුණු 50% ක් ලබා ගත යුතුයි.

| අංක | ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | අභියෝග්‍යතා පරීක්ෂණය | ගණිතමය හැකියාව හා තර්කාණුකූලව තීරණ ගැනීමේ හැකියාව උරගා බැලීමේ ප්‍රශ්ණ 50 ක් මෙම ප්‍රශ්ණ පත්‍රයට ඇතුළත් වේ | පැය 01යි | 100 යි |
| 02 | භාෂා දැනුම | සාරාංශ කිරීමේ හැකියාව හා කියවා තේරුම් ගැනීමේ හැකියාව උච්චාරණය සමාන වචන හා විරුද්ධ පද හා ලිපි ලිවීමේ හැකියාව හා ව්‍යාකරණ භාවිතය යනාදී හැකියාවන් පරීක්ෂණය කිරීම සඳහා ඉදිරිපත් කරන ප්‍රශ්න වලින් යුත් ප්‍රශ්න පත්‍රය | පැය 01 1/2 යි | 100 යි |

### 11.2 වෘත්තීය පරීක්ෂණය

| අංකය | ලකුණු ලබා දීමේ ප්‍රධාන කරුණු | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | වාහන පැදවීමට ඇති හැකියාව | 40 | 20 |
| 02 | මහා මාර්ග හා මාර්ග නීතිරීති සම්බන්ධයෙන් වූ දැනුම | 40 | 20 |
| 03 | මෝටර් රථ කාර්මිකකරණය හා විද්‍යානුකූල මූලික දැනුම | 20 | 10 |
| | **සම්පූර්ණ ලකුණු ප්‍රමාණය** | **100** | **50** |

**සටහන :-**

විභාග අපේක්ෂකයන් වෘත්තීය පරීක්ෂණයෙන් සමත් වුවද පත්වීම සඳහා තෝරා ගැනීමේ දී විවෘත තරඟ විභාගයේ දී ලබා ගන්නා අධික ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙල අනුව තෝරා ගනු ලැබේ.

**12 විභාග ප්‍රතිඵල :-**

අපේක්ෂකයන් ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ **www.np.gov.lk** වෙබ් අඩවියෙහි පළ කරන අතර පසුව උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් තැපැල් මගින් නිකුත් කරනු ලැබේ.

**13** විභාගය පැවැත්වීම සඳහා නිශ්චිත නගර හා එම නගර සඳහා වූ අංක පහත් සඳහන් වේ

| නගරය | නගර අංකය |
|---|---|
| යාපනය | 01 |
| වවුනියාව | 03 |
| කිලිනොච්චිය | 04 |

විභාගය පැවැත්වීම සඳහා එක් නගරයකින් ලැබෙන අයදුම්පත්වල සංඛ්‍යාව අඩු වූ අවස්ථාවකදී මෙම විභාගය ළඟම ඇති නගරයක පැවැත්වීමට කටයුතු කරනු ලැබේ

**14** මෙම විභාගය පැවැත්විම හා අවලංගු කිරීමේ බලය **"උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්** සතු වේ. මෙම නිවේදනයේ ඇති දෙමළ හෝ සිංහල භාෂා මාධ්‍යවල යම් කිසි වෙනසක් ඇති විටෙක, දෙමළ භාෂාවෙ සඳහන් නිවේදනය නිවැරදි නිවේදනය බව සැළකිය යුතුවේ.

**සි.ඒ.මොහාන්රාස්**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
21.02.2018